**ලංකාපුර ප්‍රාදේශීය සභාව - 2021**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකාපුර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ලංකාපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

--------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

----------------------------------------------------------------------

**1.6.1 පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------- | ------------- |
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත සමඟ ඉදිරිපත් වූ පරිශිෂ්ඨය 2 හි EG 10.1 ප්‍රකාරව ඉදිවෙමින් පවතින වත්කම් ගිණුම් තැබීමේදී වර්ෂ අවසාන නිමවුම් ප්‍රතිශතය පදනම් කරගෙන ගිණුම් තැබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් ආරම්භ කර ඉදිවෙමින් පවතින ගොඩනැගිලි වටිනාකම හා පාරවල් බෝක්කු හා පාලම් වටිනාකම ගිණුම් තැබීමේදී, නිමැවුම් ප්‍රතිශතය නොසලකා ගිවිසුම් වටිනාකම මත ගිණුම් තැබීම හේතුවෙන් ගොඩනැගිලි 11 ක රු. 43,768,010 ක අගය හා පාරවල්, බෝක්කු හා පාලම් 01 ක රු.1,503,301 ක වටිනාකම ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වේ. | ප්‍රමිත ප්‍රකාරව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත - පරිශිෂ්ඨය 2 හි EG . 2.7 ප්‍රකාරව ප්‍රාග්ධන වියදම් ප්‍රධාන ගෙවීම් කිරීමේදී, අදාල වත්කම් ගිණුමට හෝ වියදම් ගිණුම් හර කර ගෙවීම් ගිණුම බැර කර ක්ෂය | එකඟ වේ. | ප්‍රමිත ප්‍රකාරව ගිණුම් ගත කළ යුතුය. |

කිරිම ගණනය කළ පදනම මත විස්තීරණ ආදායම් ප්‍රකාශයට හඳුනාගත යුතු වුවද, 2021 වර්ෂය සඳහා අතිරික්තයේ/ ඌණතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රධාන ඒ වත්කමට අදාල ක්ෂය ප්‍රතිශතයට අනුව හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබූ බැවින් රු.1,419,651 ක් වැඩියෙන් ප්‍රාග්ධන වියදම් ප්‍රධාන ලෙස හඳුනාගෙන තිබුණි.ඒ අනුව එම ප්‍රමාණයෙන් අයභාරය අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

--------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.5 අනුව දේපල පිරියත හා උපකරණ ක්ෂය කිරිම වත්කමක ජිව කාලය පුරා හීනවන ශේෂ ක්‍රමයට එහි සඳහන් ප්‍රතිශත පදනම් කරගෙන සිදුකර ඇති බව සඳහන් කර තිබුණද, රු. 29,556,148 ක් වු වාර්ෂික ක්ෂය වටිනාකම ගණනය කිරිමේදී ඉහත ක්‍රමයෙන් බැහැරව ක්ෂය කර තිබුණි. | එකඟ වේ. හීන වන ශේෂ ක්‍රමයට ක්ෂය කිරීමේදී වත්කමෙහි පිරිවැයට වාර්ෂික ක්ෂය අනුපාතය ගණනය කළ යුතු වුවද 2021 වර්ෂයේ ආරම්භක ශේෂය යොදා ගැනීම නිසා ක්ෂය වටිනාකම වෙනස් වී ඇත. | ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවලංගු ව්‍යාපෘති දෙකක වටිනාකම ගිණුම්ගත කිරීම හේතුවෙන් පාරවල්, බෝක්කු හා පාලම් වටිනාකම රු. 999,521 කින් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | එකඟ වේ. | ප්‍රමිත ප්‍රකාරව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂය සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති වල කෙරීගෙන යන වැඩ වටිනාකම රු 1,156,153 ක් හා වැඩ නිමි පාරවල්, බෝක්කු හා පාලම් වටිනාකම රු.492,762 ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි. | එකඟ වේ. | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර වත්කම් හඳුනාගෙන නිම කිරීමේ පදනම මත ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස් විමේ ප්‍රකාශන තුල අතිරික්තයේ හෝ ඌණතාවයේ ඇතුලත් කර නොමැති | එකඟ වේ. | සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම් |

| | | | |
|---|---|---|---|
| | ප්‍රාග්ධන වියදම් දිමනා 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.82,123,780 ක් ලෙස දක්වා තිබුණද, සත්‍ය අගය රු.126,709,351 ක් විය යුතු බැවින් රු.44,585,570 ක් අඩුවෙන් දක්වා තිබුණි. එම ප්‍රමාණයෙන්ම 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශයේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය වැඩියෙන් දක්වා තිබූ අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීරණ ආදායම් අඩුවෙන් දක්වා තිබුණි. | | ප්‍රදාන නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වලට හඳුනාගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අදාළව තොග ලේඛන පරික්ෂා කිරීමේදී රු.417,879 ක් වටිනා තොගයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන වලට ඇතුළත් නොවීම හේතුවෙන් තොගය රු.417,879 ක් අඩුවෙන් පැවතුණි. | එකඟ වේ. | ලේඛන යාවත්කාලීන කර නිවැරදි අගයන් ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ 2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම රු.5,599,613 කින් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වේ. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම් තැබිය යුතුවේ. |

**1.6.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අනුව ගිණුම් විෂයයන් 06 ක වටිනාකම රු. 722,617 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | අනුරූපී වාර්තා සසඳා නිවැරදි අගයන් ගිණුම්ගත කළ යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයහාරය ඉක්ම වූ වියදම රු.7,524,216 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයහාරය ඉක්ම වූ වියදම රු.13,751,417 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ------------------- | ------------------ | ------------------ |
| **කුලී**<br>**-----** | | |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති 2003-2014 කාලච්ඡේදයේ සභාව සතු දේපල බදුදීම්, ඒකක 27 කින් ලැබිය යුතු රු.1,785,816 ක බදු කුලී 2022 ඔක්තෝබර් 01 දින වන විටත් වර්ෂ 10 කට අධික කාලයක් තිස්සේ අයනොවී පැවති අතර. මෙම කුලී අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ගද ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභාවට අය විය යුතු හිඟ මුදල් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | හිඟ ආදායම් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |